සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

Department of Examinations, Sri Lanka

10 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2007 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2007 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2007

සංයුක්ත ගණිතය I
இணைந்த கணிதம் I
Combined Mathematics I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

* ප්‍රශ්න සියයකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. (a) α හා β යනු $x^2+bx+c=0$ සමීකරණයේ මූල වේ. α^3 හා β^3 මූල වන වර්ගජ සමීකරණය, b හා c ඇසුරෙන් සොයන්න.

ඒ නයින්, $\alpha^3+\frac{1}{\beta^3}$ හා $\beta^3+\frac{1}{\alpha^3}$ මූල වන වර්ගජ සමීකරණය, b හා c ඇසුරෙන් සොයන්න.

(b) $f(x)$ යනු, මාත්‍රය 3 ට වැඩි, x හි බහු පදයකි. පිළිවෙළින් $(x-1)$, $(x-2)$ හා $(x-3)$ යන්නෙන් $f(x)$ බෙදූ විට ලැබෙන ශේෂ a, b හා c වේ. ශේෂ ප්‍රමේයය නැවත නැවත යෙදීමෙන්, $(x-1)(x-2)(x-3)$ යන්නෙන් $f(x)$ බෙදූ විට ලැබෙන ශේෂය $\lambda(x-1)(x-2)+\mu(x-1)+\upsilon$ ලෙස ප්‍රකාශ කළ හැකි බව පෙන්වන්න; මෙහි λ, μ හා υ යනු නියත වේ.

a, b හා c ඇසුරෙන් λ, μ හා υ සොයන්න.

2. (a) අපේක්ෂකයකු විභාගයක දී, එක් එක් කොටසක ප්‍රශ්න හතර බැගින් අඩංගු A, B හා C නම් කොටස් තුනක් යටතේ දෙන ලද ප්‍රශ්න දෙළහකින්, ප්‍රශ්න හයකට පිළිතුරු සැපයිය යුතු ය.

(i) එක් එක් කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය නම්,

(ii) ඕනෑම කොටසකින් ප්‍රශ්න තුනකට වඩා වැඩියෙන් ඔහුට පිළිතුරු සැපයිය නොහැකි නම්,

(iii) එක් එක් කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයකවත් පිළිතුරු සැපයීම අනිවාර්ය නම්,

අපේක්ෂකයාට ප්‍රශ්න හය තෝරාගත හැකි වෙනස් ආකාර ගණන සොයන්න.

(b) ධන නිඛිලමය දර්ශකයක් සඳහා ද්විපද ප්‍රමේයය ප්‍රකාශ කරන්න.

a, b හා d යනු $a=b+d$ වන අයුරින් වූ නිඛිල වේ. $a^n-b^{n-1}(b+nd)$ යන්න ධන නිඛිලමය n සඳහා d^2 න් බෙදිය හැකි බව පෙන්වන්න.

U යනු පළමු පදය a හා පොදු අන්තරය d වන සමාන්තර ශ්‍රේඩියක n වෙනි පදය නම්, $a^n-(a-d)^{n-1}U$ යන්න d^2 න් බෙදිය හැකි බව සාධනය කරන්න.

$7^{60}-3^{64}$ යන්න 16 න් බෙදිය හැකි බව අපෝහනය කරන්න.

3. (a) ගණිත අභ්‍යුහන මූලධර්මය උපයෝගී කර ගනිමින්, ධන නිඛිලමය n සඳහා $\frac{n^7}{7}+\frac{n^5}{5}+\frac{n^3}{3}+\frac{34n}{105}$ යන්න නිඛිලයක් බව සාධනය කරන්න.

(b) $\frac{3}{1.2}\left(\frac{1}{2}\right)+\frac{4}{2.3}\left(\frac{1}{2}\right)^2+\frac{5}{3.4}\left(\frac{1}{2}\right)^3+\ldots$ ශ්‍රේණියේ r වෙනි පදය වන u_r ලියා දක්වන්න.

$u_r=f(r-1)-f(r)$ වන අයුරින් $f(r)$ සොයන්න.

ඒ නයින්, $S_n=\sum_{r=1}^{n} u_r$ සොයන්න.

$\lim_{n\to\infty} S_n$ අගයන්න.

< www.sinhalalibrary.com > Source :- www.pastpaperlk.com 1

(a) $z_1 = \frac{\sqrt{3}}{2} + i\frac{1}{2}$ හා $z_2 = -\frac{1}{2} + i\frac{\sqrt{3}}{2}$ සංකීර්ණ සංඛ්‍යා, ආගන්ඩ් සටහනක පිළිවෙළින් A හා B ලක්ෂ්‍ය මගින් නිරූපණය කෙරෙයි. Arg z_1 හා Arg z_2 සොයන්න.

$OACB$ යනු ආගන්ඩ් සටහනේ සමචතුරස්‍රයක් යැයි දී ඇත්නම්, C මගින් නිරූපණය කරනු ලබන සංකීර්ණ සංඛ්‍යාවේ මාපාංකය හා විස්තාරය සොයන්න; මෙහි O යනු මූල ලක්ෂ්‍යය වේ.

(b) (i) $\left|z-\left(\frac{1}{2}+i\frac{\sqrt{3}}{2}\right)\right| \leq 2$ අවශ්‍යතාව යටතේ $|z-3|$ හි අඩුතම හා වැඩිතම අගයන් සොයන්න.

(ii) $\text{Arg}\,(z-1) = \frac{\pi}{6}$ අවශ්‍යතාව යටතේ $|z|$ හි අඩුතම අගය සොයන්න.

(a) (i) ඕනෑම r ධන නිඛිලයක් සඳහා $\frac{d^r}{dx^r}\left(xe^x\right) = (x+r)e^x$ බව පෙන්වන්න.

(ii) $y = x^2 e^x$ නම් $\frac{dy}{dx} = 2xe^x + y$ බව සාධනය කරන්න.

$\frac{d^r y}{dx^r} - \frac{d^{r-1} y}{dx^{r-1}} = 2(x+r-1)e^x$ බව අපෝහනය කරන්න.

ඒ නයින්, ඕනෑම n ධන නිඛිලයක් සඳහා $\frac{d^n y}{dx^n} = n(2x+n-1)e^x + y$ බව පෙන්වන්න.

(b) $P\left(at^2, at^3\right)$ ලක්ෂ්‍යයේ දී $ay^2 = x^3$ වක්‍රයට ඇඳි ස්පර්ශකය Q හි දී නැවතත් වක්‍රයට හමුවේ; මෙහි a යනු නියතයකි. t ඇසුරෙන් Q හි බණ්ඩාංක සොයන්න.

(a) භින්න භාග උපයෝගී කරගනිමින් $\int \frac{x^3+1}{x(x-1)^3}\,dx$ සොයන්න.

(b) $25\cos x + 15 \equiv A(3\cos x + 4\sin x + 5) + B(-3\sin x + 4\cos x) + C$ වන ආකාරයට A, B හා C සොයන්න.

ඒ නයින්, $\int \frac{25\cos x + 15}{3\cos x + 4\sin x + 5}\,dx$ සොයන්න.

(c) කොටස් වශයෙන් අනුකලනය උපයෝගී කරගනිමින්,

$\int_0^{\frac{\pi}{2}} \sin^6 x\,dx = \frac{5}{6}\int_0^{\frac{\pi}{2}} \sin^4 x\,dx = \frac{5.3}{6.4}\int_0^{\frac{\pi}{2}} \sin^2 x\,dx = \frac{5\pi}{32}$ බව පෙන්වන්න.

ඒ නයින්, $\int_0^{\frac{\pi}{6}} \sin^6 3x\,dx$ අගයන්න.

7. ABC යනු $A \equiv (2, 4)$ ද, $y = x + 1$ රේඛාව මත B හා C ද, වන අයුරින් වූ ත්‍රිකෝණයක් යැයි ගනිමු. ABC හා ADE ත්‍රිකෝණවල වර්ගඵල $9 : 4$ අනුපාතයට වන අයුරින් BC ට සමාන්තරව අඳින ලද l නම් රේඛාවක්, AB හා AC පිළිවෙළින් D හා E හි දී කපයි. G යනු A සිට l ට ඇඳි ලම්බයේ අඩිය ද, M යනු AB තුළ G හි දර්පණ ප්‍රතිබිම්බය ද යැයි ගනිමු.

(i) G හි බණ්ඩාංක හා l හි සමීකරණය සොයන්න.

(ii) $AM = AG$ බව පෙන්වන්න.

ඒ නයින් හෝ වෙනත් ක්‍රමයකින් හෝ, B ලක්ෂ්‍යය $y = x + 1$ රේඛාව මත චලනය වන විට M ලක්ෂ්‍යය, කේන්ද්‍රය A හා අරය $\frac{\sqrt{2}}{3}$ වූ වෘත්තයක් මත චලනය වන බව සාධනය කරන්න.

8. වෘත්ත දෙකකට, ඒවායේ ඡේදන ලක්ෂ්‍ය එක එකක දී අඳින ලද ස්පර්ශක දෙක සෘජුකෝණික වන විට එම වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනය වේ යැයි කියනු ලැබේ. $x^2 + y^2 + 2gx + 2fy + c = 0$ හා $x^2 + y^2 + 2g'x + 2f'y + c' = 0$ වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනයවීම සඳහා අවශ්‍යකාව සොයන්න.

$$x^2 + y^2 + 4x + 2\lambda y - 6 = 0 \ldots\ldots\ldots (*)$$

සමීකරණය $\left(-2 + \sqrt{10}, 0\right)$ හා $\left(-2 - \sqrt{10}, 0\right)$ ලක්ෂ්‍ය හරහා යන වෘත්ත පද්ධතියක් නිරූපණය කරන බව සාධනය කරන්න; මෙහි λ යනු පරාමිතියකි.

$S = 0$ යනු $(*)$ මගින් නිරූපණය කෙරෙන පද්ධතියට අයත් වෘත්තයක් වේ. $S = 0$ ව ප්‍රලම්බ, එම පද්ධතියටම අයත් අනන්‍ය $S' = 0$ වෘත්තයක් පවතින බව පෙන්වන්න.

$S \equiv x^2 + y^2 + 4x + 4y - 6 = 0$ වන විට $S' = 0$ සොයන්න.

$S = 0$ හා $S' = 0$ දෙකටම ප්‍රලම්බ වෘත්තයේ සාධරණ සමීකරණයක් සොයන්න.

9. (*a*) **සුපුරුදු අංකනයෙන්, සයින් නීතිය ප්‍රකාශ කරන්න.**

P යනු $\angle PAB = \angle PBC = \angle PCA = \varphi$ වන අයුරින් ABC ත්‍රිකෝණය ඇතුළත වූ ලක්ෂ්‍යයකි.

ABC ත්‍රිකෝණයේ වර්ගඵලය, සුපුරුදු අංකනයෙන්, $\frac{abc}{2}\left(\frac{BP}{bc} + \frac{CP}{ac} + \frac{AP}{ab}\right)\sin\varphi$ බව සාධනය කරන්න.

$\frac{1}{\sin^2\varphi} = \frac{1}{\sin^2 A} + \frac{1}{\sin^2 B} + \frac{1}{\sin^2 C}$ බව අපෝහනය කරන්න.

(*b*) (i) $2\tan^{-1}\left(\frac{1}{5}\right) = \tan^{-1}\left(\frac{5}{12}\right)$,

(ii) $2\tan^{-1}\left(\frac{5}{12}\right) = \tan^{-1}\left(\frac{120}{119}\right)$,

(iii) $\tan^{-1}\left(\frac{120}{119}\right) - \frac{\pi}{4} = \tan^{-1}\left(\frac{1}{239}\right)$

බව පෙන්වන්න.

$4\tan^{-1}\left(\frac{1}{5}\right) - \tan^{-1}\left(\frac{1}{239}\right) = \frac{\pi}{4}$ බව අපෝහනය කරන්න.

* * *

< www.sinhalaelibrary.com > Source :- www.pastpaperlk.com